සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11** |
| **Third Term Test 2020** | **Grade 11** |

| | | |
|---|---|---|
| **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** | **II** | **පැය දෙකයි** |
| தொடர்பாடலும் ஊடகவியற் கற்கையும் | II | இரண்டு மணித்தியாலம் |
| Communication & Media Studies | II | Two hours |

◆ **<u>පළමු ප්‍රශ්නය ඇතුලුව</u> ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හදාරණ 11 වසර සිසු සිසුවියෝ සිය වාර්ෂික මාධ්‍ය දින වැඩසටහන අති උත්කර්ෂවත් ලෙස සිදු කිරීමට සාකච්ඡා කරමින් සිටිති. උත්සවය වර්ණවත් කිරීමටත්, අර්ථවත් කිරීමටත් සන්නිවේදන ක්ෂේත්‍රයේ මුදුන් මල්කඩක් බඳු සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් මේ මොහොතට කැඳවා ගැනීම ඔවුන්ගේ එකම අභිප්‍රායයි.**

i. ඉහත සඳහන් අවස්ථාව අයත් වන්නේ කුමන සන්නිවේදන වර්ගයකට ද?

ii ඉහත i හි ඔබ දක්වන සන්නිවේදන වර්ගයට අයත් සුවිශේෂතා 2 ක් ලියන්න.

iii. මාධ්‍ය දින වැඩසටහනට කැඳවා ගැනීමට අදහස් කරන අමුත්තන්ට ආරාධනා කිරීම සඳහා ඔබට භාවිතා කළ හැකි සම්ප්‍රදායික හා නව ක්‍රම එක බැගින් දක්වන්න.

iv. මාධ්‍ය දින වැඩසටහනට කැඳවන මහාචාර්ය තුමාගේ දේශනය සාර්ථක කර ගැනීම සඳහා යොදා ගත හැකි ප්‍රක්ෂේපණීය මාධ්‍ය උපකරණ 2 ක් නම් කරන්න.

v. කවීෂා මාධ්‍ය දින උත්සවයේ දී එළි දැක්වීමට (දොරට වැඩීමට) පද්‍ය පොතක් නිර්මාණය කරයි. නිර්මාණ බිහි කිරීම බුද්ධිමය දේපලකි. බුද්ධිමය දේපල සම්බන්ධ අයිතිවාසිකම් 2 නම් කරන්න.

vi. මෙම මාධ්‍ය දින වැඩසටහනේ සුවිශේෂී තැන් නිමේෂා තම රුසියාවේ සිටින තාත්තාට ද දන්වයි. ඇයට ඒ සඳහා යොදාගත හැකි නව මාධ්‍ය විධික්‍රම 2 ක් නම් කරන්න.

vii. මෙම මාධ්‍ය දින වැඩසටහන පිළිබඳ ව පුවත්පතක විස්තර ප්‍රචාරය කිරීමට සිසුහු කල්පනා කරති. ඔවුන්ට උත්සවයට පෙර හා පසුව ඒ පිළිබඳව පුවත් පතකට තොරතුරු ඇතුලත් කළ හැකි ආකාර 2 ක් සඳහන් කරන්න.

viii. කොතෙකුත් සංවිධානය කළත් මෙවැනි උත්සවයකදී වුවත් සන්නිවේදන බාධා ඇති විය හැකිය. ප්‍රධාන සන්නිවේදන බාධා 2 ක් නම් කරන්න.

ix. ලේඛනයෙහි නිපුණ සංගීතා ප්‍රධාන ආරාධිත අමුත්තෙකු ලෙස සහභාගී වන දේශකතුමන්ට පිරිනැමීමට පාසලේ ඉතිහාසය පිළිබඳ වාර්තාවක් සකසයි. ඇයගේ වාර්තා ලිපිය ඵලදායී ලේඛනයක් වීමට තිබිය යුතු ලක්ෂණ 2 ක් ලියන්න.

x. උත්සවය පිළිබඳව මතක සටහන් තබා ගැනීමට සිසුහු සියල්ලෝම රුචි වූහ. ඔවුන්ට මෙම උත්සවය පිළිබඳ ව මතක සටහන් තබා ගත හැකි නවීන සන්නිවේදන ක්‍රම 2 ක් ලියන්න.

(2×10 = 20)

02. **ජනමාධ්‍ය, නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය වර්තමානයේ නැතිව ම බැරි අංගත්‍රයක් වී ඇත.**

i. අභිසාරී මාධ්‍ය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල. 01)

ii. ජනමාධ්‍ය බෙදෙන ප්‍රධාන කොටස් 2 දක්වා නිදසුන් 2 බැගින් දක්වන්න. (ල. 02)

iii. අන්තර් පුද්ගල සන්නිවේදන අවස්ථාවක් සාර්ථක කර ගැනීමට භාවිත කළ හැකි නිර්වාචික සන්නිවේදන ක්‍රම 3 ක් නිදසුන් සහිත ව පහදන්න. (ල. 03)

iv. සමූහ සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර පවතින වෙනස්කම් 4 ක් නිදසුන් සහිත ව පහදන්න. (ල. 04)

**03. විවිධ මාධ්‍ය උපකරණයන්ගේ සහයෙන් අද බොහෝ කාර්යයන් පහසු හා සරල වී ඇත.**

i. ප්‍රක්ෂේපණීය නොවන පන්ති කාමර මාධ්‍ය උපකරණ 2 ක් නම් කරන්න. (ල. 01)

ii. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ (DTP) ප්‍රයෝජන 4 ක් දක්වන්න. (ල. 02)

iii. ප්‍රක්ශේපණීය මාධ්‍ය උපකරණ යොදා ගනිමින් සිදු කරන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක වාසි 3 ක් කෙටියෙන් පහදන්න. (ල. 03)

iv මාධ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය කෙරෙහි රජය ඍජු ව හා වක්‍ර ව මැදිහත් වන අවස්ථා 4 ක් කෙටියෙන් දක්වන්න. (ල. 04)

**04. සියලු මාධ්‍ය ආයතන ප්‍රවෘත්ති වාර්තාකරණයට සුවිශේෂී ස්ථානයක් හිමිකර දෙයි.**

i. වැඩි දෙනාගේ අවධානය හා කැමැත්ත දිනා ගන්නා, මානව හැඟීම්වලට ආමන්ත්‍රණය කරන පුවත් හඳුන්වන නාමය වන්නේ, (ල. 01)

ii. ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක 4 ක් නම් කරන්න. (ල. 02)

iii. තොරතුරක් ඉදිරිපත් කිරීමේ දී සැලිකිලිමත් විය යුතු කරුණු 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

iv ප්‍රවෘත්ති වාර්තාකරණය හා නිර්මාණාත්මක රචනය, රූප සටහන් ඇසුරින් පහදන්න. (ල. 04)

**05. පෙර අන් කිසිදාකටත් වඩා වර්තමානයේ රූපවාහිනියේ බලපෑම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.**

i. ලොව ප්‍රථම මුද්‍රණ යන්ත්‍රයේ නිර්මාතෘවරයා කවුද? (ල. 01)

ii. රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද 4 ක් නම් කරන්න. (ල. 02)

iii. ''රූපවාහිනී මාධ්‍ය මගින් ළමා හා තරුණ පරපුරට මෙන් ම සමාජයට ද දැඩි බලපෑමක් එල්ල කරයි.'' ඉහත කියමන කරුණු 3 ක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

iv විචාරශීලී ග්‍රාහකයෙකු ලෙස මාධ්‍ය බලපෑමට හසු නොවී සිටීමට ග්‍රාහකයෙකු සතුවිය යුතු නිපුණතා 4 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

**06. ග්‍රාහක ආකර්ශනය, සන්නිවේදකයාගේ තෘප්තිය හා වාණිජ පරමාර්ථ මූලික කොටගෙන සන්නිවේදනය නිර්මාණශීලී ව යොදාගනු ඇත.**

i. අපූර්වත්වය යනු කුමක්ද? (ල. 01)

ii. නිර්මාණයක තිබිය යුතු ගුණාංග 4 දක්වන්න. (ල. 02)

iii. නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගන්නා ප්‍රකාශන විධි 3 ක් නිදසුන් මගින් පහදන්න. (ල. 03)

iv ඔබ පාසලේ කලා උළෙලේ දැකිය හැකි නිර්මාණාත්මක ප්‍රකාශන අවස්ථා 4 ක් නම් කර ඉන් 2 ක ඇති නිර්මාණශීලී බව විස්තර කරන්න. (ල. 04)

**07. ''නිර්මාණශීලී ඇසක් හා නිර්මාණාත්මක චින්තනයක් ඇති අයෙකුට නිර්මාණශීලී ඡායාරූපකරණයේ යෙදිය හැකිය''**

i. නිශ්චල ඡායාරූපයක් යනු කුමක් ද? (ල. 01)

ii. නිශ්චල ඡායාරූප මුද්‍රිත මාධ්‍යයේ භාවිතා කිරීමෙන් මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි 4 ක් දක්වන්න. (ල. 02)

iii. අංකිත හෙවත් ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතා (ප්‍රයෝජන ) 3 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

iv ඡායාරූප ශිල්පියෙකු ඡායාරූපගත කිරීමේ දී පිළිපැදිය යුතු ආචාරධර්ම 4 ක් නිදසුන් සහිත ව විස්තර කරන්න. (ල. 04)